# තේ තතු

තේ සොබාදායි පානයකි

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි

ISSN - 1391- 6785

පස්වන කාණ්ඩය පළමුවන කලාපය 2005


25 MAY 2005

## පස් නොසලකන්නන්ට ගස් සලකයිද?

**පස** යනු තේ වගාවට ඉතාම වැදගත් සාධකයක්. පස තමයි තේ ගස දරා ගෙන ඉන්නේ. ඒ වගේම පස් වල තමයි ගසේ වර්ධනයට අවශ්‍ය ශාක පෝෂක රඳවා තබා ගන්නේ. පසට හොඳින් සැලකුවොත් තමයි ගස් හොඳින් වර්ධනය වෙන්නේ. ඉතිං අපි අපේ තේ ඉඩමේ පස් ගැන අනිවාර්යයෙන් ම සැලකිලිමත් වෙන්න ඕනී.



අපගේ පරණ තේ වගාව ගලවා අළුතෙන් තේ පැල සිටුවන්න ඉස්සෙල්ලා ඉඩමේ ගෝතමාලා හෝ මානා සිටුවා පස් සරු කල යුතුයි. මේ වගේ තෘණ වර්ග මාස 18-24 විතර වගා කරන කොට තන්තු සහිත මුල් දිරා ගිහිල්ල පසට කාබනික ද්‍රව්‍ය එකතුවෙනව වගේම පසේ වාත අවකාශ දියුණු වෙනවා. එවිට කුඩා පැලවල මුල් වර්ධනය පහසුවෙන් හා වේගයෙන් සිදුවෙලා හොඳ ශක්තිමත් මූල පද්ධතියක් තේ පැලයට ලැබෙනවා. එහෙම සරු මූල පද්ධතියක් තියෙන තේ පැලයක් නියඟයටත් ඉතා සාර්ථකව මුහුන දෙනව.

කුඩා තේ වතු හිමියන් නිතර කරන මැසිවිල්ලක් තමයි කොච්චර පොහොර දැම්මත් දළු අඩුයි කියන එක. රසායනික පොහොර උවමනාවටත් වඩා යෙදුවත් කාබනික ද්‍රව්‍ය පසේ නැත්නම්, රසායනික පොහොර රැඳෙන්නේ නැහැ. අපි යොදන රසායනික පොහොර පසේ ඉහල ස්ථරවල රැඳී නොතිබුනොත් ඒවා මුල් වලට උරා ගන්න බැරිව යනව. පසට කාබනික පොහොරත් එකතු කරනව නම් එම දිරා ගිය කාබනික ද්‍රව්‍ය වලට පුළුවනි රසායනික පොහොර එකතු කරල තියාගන්න. ඒ නිසා තමයි අවුරුදු දෙකක් අපිට ලාබයක් නැතත් අළුත් තේ වගාවක් ආරම්භ කිරීමට ඉස්සෙල්ලා තෘණ වගා කරන්න කියලා තේ පර්යේෂණායතනය නිර්දේශ කරන්නෙ. ඒත් බොහෝවිට ඉක්මන් ලාභයට තවමත් අපේ සමහර අය පස පුනරුත්තාපනය කරන්නේ නැතිව පැල සිටුවනවා.



අපට සපයා ගැනීමට පහසුනම් දිරාගිය කොහුබත්, කසල තේ හෝ ගෙවතු පොහොර පවා අපගේ තේ ඉඩමට එකතු කරනවා නම් ඒ සැලකීම සරු පසකට හේතු වෙනව. පස සරු නම් තේ අස්වැන්න හොඳ වෙනවා.

පසේ ඉන්න ගැඩවිල් පනුවො ඒ වගේම අනෙකුත් ඇයට නොපෙනෙන ජීවීන් තේ වගාවේ හොඳ මිතුරො. ඒ අය තමයි කාබනික ද්‍රව්‍ය ජීරණය කරල වාත අවකාශ වැඩි කරල පස සරු කරන්නෙ. ඉතින් අපි එතරම් හිතන්නෙ නැතිව වල් නාශක, කෘමි නාශක වර්ග හිතුමනාපයට තේ වගා බිම් වලට යෙදුවම මේ ජීවීන් විනාශ වෙනවා. ඒ වගේම තේ වගා බිම් වල තිබෙන පාරිසරික සමබරතාවය නැති වෙලා පස ජීවයක් රහිත, තේ මුල් වල වර්ධනයට අපහසු තත්වයන් ඇති කරනවා.

සෝදා පාළුව වැලැක්වීමට හොඳ කාණු පද්ධතියක් ඇති කිරීම මගින් පස මතු පිට ඇති කාබනික ද්‍රව්‍ය සෝදා පාළුවට ලක් වීම වැලැක්වීමටත් හැකිවෙනව.තවද අළුත් වගාවක් ආරම්භ කලාට පස්සේ ගුවාතමාලා හෝ මානා පස මතු පිට අතුරලා පස ආවරණය කරන්න අවශ්‍යයි. එවිට වැසි ජලය මගින් සිදුවන සෝදා පාළුව වලකිනව. ඒ වගේම මේ ශාක කොටස දිරා යාම නිසා පසට කාබනික පොහොර එකතු වෙනවා. තවද පසේ ජලය රඳවා තබා ගැනීමේ ශක්තියත් වැඩිවෙනවා. මේ විදියට පසට සත්කාර කරන කොට තේ ගස් හොඳින් දළු ලියලලා තේ වතු හිමියාගේ අත මිට සරු කරනවා.

**සුරංජන් ප්‍රනාන්දු, ව්‍යාප්ති නිලධාරි**